# ජාතික ආදයම හා වියදම

## සමස්ථ උපනතීන්

නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් මගින් උද්දීපනය කරන ලද ආර්ථික වර්ධන ප්‍රවනතාවයේ අඛණ්ඩ පැවැත්ම පිළිබිඹු කරමින්, 1994 දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය, 1982 හි ස්ථාවර සාධක වියදම් මිළ අනුව, සියයට 5.6 කින් වර්ධනය විය. මෙය, පසුගිය වර්ෂයේ වාර්තා කළ සියයට 6.9 ක වර්ධන අනුපාතිකය හා මනාව සැසඳේ. ආර්ථිකයේ සෑම අංශයක්ම සමස්ත ආර්ථික වර්ධනයට යහපත් ආකාරයෙන් දායක විය. කෘෂිකර්මාන්තය, නිමැවුම් කර්මාන්තය, ඉදිකිරීම්, වෙළෙඳාම සහ මූල්‍ය කටයුතු හා සම්බන්ධ නිෂ්පාදනය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

විදේශීය ශුද්ධ සාධක ආදයම සඳහා ගැලපුම් කරන ලද දළ දේශිය නිෂ්පාදිතය හෙවත් දළ ජාතික නිෂ්පාදිතය 1993 දී වාර්තා කළ සියයට 7.7 ක වර්ධන අනුපාතයට සාපේක්ෂව 1994 දී සියයට 5.3 කින් වර්ධනය විය. දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගයට, තරමක් අඩු මට්ටමක පැවැතීම, 1994 වර්ෂයේ විදේශ ශුද්ධ සාධක ආදයම පිටතට ගලායාමේ වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය. මෙසේ ශුද්ධ සාධක ආදයම පිටතට ගලායාම වැඩිවීමට බටහිර රටවල පොළී අනුපාත ඉහළ යාම, දේශීය පොළී අනුපාත පහත බැසීම හා දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොලේ අස්ථාවරත්වය යන සාධකද ඉවහල් වන්නට ඇත.

දළ ජාතික නිෂ්පාදිතයේ සමස්ත වර්ධනය කෙරෙහි සෑම අංශයක්ම යහපත් දායකත්වයක් සැපයූ අතර, නිමැවුම් කර්මාන්තයේ දයකත්වය අනෙක් අංශ අභිබවා සිටියි. කාර්මික භාණ්ඩ අපනයනයේ වර්ධනය මගින් මෙහෙයවනු ලැබූ නිමැවුම් කර්මාන්ත අංශය 1994 වසරේදී සියයට 9.1 ක මූර්ත වර්ධන වේගයක් වාර්තා කළ අතර, පෙර වර්ෂයේ එම වර්ධනය සියයට 10.5 ක් විය. නිමැවුම් කර්මාන්ත අංශය 1994 සමස්ත නිෂ්පාදන වර්ධනයෙන් සියයට 33 කට දයක විය. කෘෂිකර්මාන්තය සහ වෙළඳාම යන අංශයන්ගේ දයකත්වයද පිළිවෙලින් සියයට 13 හා සියයට 26 වශයෙන් ඉතා ඉහළ මට්ටමක පැවතුනි. 1994 දී පැවති යහපත් කාලගුණික තත්ත්වය තේ, රබර්, පොල්, වී සහ අතුරුභෝග යන අංශයන්ගේ ඉහළ නිෂ්පාදනයන් ඇති කිරීමට හේතු විය. දැව හා ධීවර යන අංශ දෙක ද ඇතුළත් කෘෂිකාර්මික අංශය මෙම වසර තුල සියයට 3.3 වර්ධනයක් වාර්තා කළේය. පසුගිය වසරේදී මෙම අංශය වාර්තා කළ වර්ධන වේගය සියයට 4.9 ක් විය. කෙසේ වුවද, කලින් වසරේ සාපේක්ෂ ඉහළ වර්ධන වේගයට හේතු වූයේ 1992 පැවති නියඟය නිසා එම වර්ෂයේදි වූ පහළ නිෂ්පාදන මට්ටමක් මත 1993 වර්ධනය පදනම් විමයි. මෑත වර්ෂවලදී වාර්තා කල ඉහළ වර්ධන වේගය තවදුරටත් පවත්වා ගැනිමට ඉදිකිරීම් අංශය සමත්විය. රට තුළ ඇතිවුන දිගුකාලීන ආයෝජන වාතාවරණය තවදුරටත් පවතින බව මෙමගින් පිළිබිඹු විය. ඉදිකිරීම් කර්මාන්තයෙහි ඇති වූ ප්‍රසාරණය පතල් හා කැනීම් අංශයේ වර්ධනයට හිතකර ලෙස දයක විය. මෙම අංශය 1994 දි සියයට 6.0 ක වර්ධනයක් වාර්තා කළේය. මැණික් සඳහා පවතින අපනයන ඉල්ලුම වර්ධනය වීම පතල් අංශයේ වර්ධනයට ද; නිමැවුම් කර්මාන්ත සහ ඉදිකිරීම් කර්මාන්තය යන අංශ වලින් වර්ධනය වූ දේශීය ඉල්ලුම කැනීම් අංශයේ වර්ධනයට ද හේතු විය. ආර්ථිකයේ ප්‍රාථමික හා ද්විතියික අංශයේ වර්ධනයන් අනුගමනය කරමින් සේවා අංශයද, 1993 දී පැවති සියයට 6.3 ක වර්ධනයට සාපේක්ෂව 1994 දි සියයට 5.2 කින් වර්ධනය විය.

සේවා අංශය සලකා බලන විට තොග සහ සිල්ලර වෙළෙඳාම සහ බැංකු හා මූල්‍ය සේවාවන් ඉහළ වර්ධනයක් වාර්තා කළේය. ආනයන හා අපනයනයන්හි පිළිවෙලින් සියයට 9.4 ක හා 12.8 ක වූ මූර්ත වර්ධනය, වෙළඳ අංශයේ ප්‍රබල වර්ධනයට හේතු විය. ආර්ථිකයේ ප්‍රධාන අංශයන්ගේ වර්ධනයත් ඒ හා සම්බන්ධ මූල්‍ය සේවා කටයුතු වර්ධනය වීමත් නිසා බැංකු කටයුතු, රක්ෂණ හා නිශ්චල දේපළ යන අංශය 1994 දි සියයට 9.5 කින් වර්ධනය විය. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා පසුගිය වර්ෂය හා සසඳන විට සියයට 9.9 කින් වර්ධනය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ජල විදුලිය උත්පාදනය පසුගිය වර්ෂය සමග සසඳන විට සියයට 7.7 කින් වර්ධනය විමයි. සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත සේවාවන් සාමාන්‍ය වර්ධනයන් පෙන්නුම් කළ අතර, එය 1994 දි සියයට 3.9 කින් පමණ වර්ධනය වු සංචාරකයින්ගේ

පැමිණීම මත පදනම් විය. සංචාරක කර්මාන්තය හා ඒ හා සම්බන්ධ සේවාවන්ද ඇතුලත් සේවා අංශය (අ. නැ. නො.) සියයට 2.5 කින් වර්ධනය විය.

1982 ස්ථාවර සාධක වියදම් මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 159 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ඉකුත් වර්ෂයට වඩා සියයට 5.6 ක වැඩිවීමකි. 1982 ස්ථාවර සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 157 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1993 වර්ෂය හා සසඳන විට සියයට 5.3 ක වර්ධනයකි. 1993 දි බටහිර රටවල පොළී අනුපාතයන් පහළ මට්ටමක පැවතීමත්, දේශීය පොළී අනුපාතයන් ඉහළ මට්ටමක පැවතීමත් නිසා ලාභාංශ පිටතට ගලායාම සීමාවුවත් 1994 ඊට ප්‍රතිවිරුද්ධ වූ තත්වයන් ක්‍රියාත්මකවී මෙම පොළී අනුපාත අතර වෙනස අඩුවීම නිසා විදේශීය සාධක ආදයම පිටතට ගලායාම වැඩි විය. මීට අමතරව, දේශීය ප්‍රාග්ධන වෙළෙඳ පොලේ ඇතිවූ අස්ථාවර භාවයද ප්‍රාග්ධනය ගලා යාමට හේතු විය. 1994 දි මහ බැංකුව වෙතැති විදේශීය වත්කම් ඉහළ යාමට අනුකූලව ආයෝජන ආදයම් ඉහළ ගියත්, එම වැඩිවීම විදේශීය විනිමය පිටතට ගලායාමෙහි වූ වර්ධනය හිලව් කිරීමට අසමත් විය. එහි ප්‍රතිඵලය වූයේ විදේශීය ශුද්ධ සාධක ආදයම් පිටතට ගලායාම වර්ධනය විමයි.

පවත්නා සාධක වියදම් මිල අනුව 1994 දි දළ ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 515 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1993 පැවති රුපියල් බිලියන 447 හා සසඳන විට සියයට 15.2 ක වර්ධනයකි. ඒ අනුව ආර්ථිකයේ සමස්ත මිළ වෙනස්වීම් ගණනය කරන මිණුමක් වන ගම්‍ය මිළ දර්ශකය 1994 දී සියයට 9.4 කින් වර්ධනය වූ ලෙස ඇස්තමේන්තු කර ඇත. 1993 දි පැවති සියයට 9.5 ක වර්ධනය හා සාපේක්ෂව බලනවිට මෙය 1994 මිළ ගණන්වල වැඩිවීම සුළු වශයෙන් සමනය වීමක් පෙන්නුම් කරයි.

1994 දි මැදි වසර ජනගහනය මිලියන 17.87 ලෙස ඇස්තමේන්තු කර ඇත. එබැවින් පවත්නා සාධක වියදම් මිළ අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය 1993 දි පැවති රුපියල් 25,377 (ඇ. ඩොලර් 526) සිට 1994 රුපියල් 28,843 (ඇ. ඩොලර් 584) දක්වා සියයට 13.7 කින් වර්ධනය විය. 1994 දී මූර්ත ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සියයට 3.9 ක් විය.

ආර්ථිකය තුළ අන්තර් ජාතික වෙළෙඳාමෙහි ඇති වැදගත්කම වැඩිවෙමින් පැවතීමේ ප්‍රවණතාවය තුළ ආනයන හා අපනයනයන්හි සාපේක්ෂ මිලගණන් වල සිදුවන වෙනස, එනම්; වෙළෙඳ අනුපාතයේ සිදුවන වෙනසක්, ජාතික ආදයම කෙරෙහි බලපෑමක් ඇති කරයි. මෙම බලපෑම මූර්ත ජාතික ආදයම තුළින් ග්‍රහණය කරගත හැකි අතර, එමගින් රටෙහි මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ ක්‍රය ශක්තියපෙන්නුම් කෙරේ. 1993 දී සමස්ත වෙළෙඳ අනුපාතය සියයට 2.0 ක වර්ධනයක් පෙන්නුම් කළද, 1994 දී එය සියයට 4.7 කින් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ අනුපාතයට අනුව ගැලපුම් කරන ලද මූර්ත දළ ජාතික නිෂ්පාදිතය හෙවත් මූර්ත දළ ජාතික ආදයම 1993 පැවති සියයට 8.4 වර්ධනයට සාපේක්ෂව 1994 දි සියයට 4.3 කින් වර්ධනය විය.

වක්‍ර බදු එකතු කිරීම හා සහනාධාර අඩුකිරීම මගින් ගැලපුම් කරන ලද ස්ථාවර සාධක වියදම් අනුව දළ ජාතික නිෂ්පාදිතය හෙවත් පවත්නා වෙළෙඳපොල මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය 1994 දී රුපියල් බිලියන 576 ක් වූ අතර, එය 1993 දී පැවති රුපියල් බිලියන 500 හා සසඳන විට සියයට 15.2 ක වැඩිවීමකි. මේ අනුව පවත්නා වෙළෙඳපොල මිළගණන් යටතේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය 1993 දී පැවති රුපියල් 28,357 (ඇ. ඩොලර් 588) සමග සැසඳීමේදී 1994 දී රුපියල් 32, 231 (ඇ. ඩොලර් 652) දක්වා සියයට 13.7 කින් වර්ධනය විය.

වියදම් අංශයෙන් බලන කල, පවත්නා වෙළෙඳ මිල අනුව දළ දේශීය වියදම 1994 දී රුපියල් බිලියන 648 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇති අතර, එය 1993 පැවති රුපියල් බිලියන 547 ට වඩා සියයට 18.3 ක වැඩිවීමකි. පවත්නා මිළ ගණන් යටතේ, පරිභෝජන වියදම සියයට 17.0 කින් වර්ධනය වූ අතර, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 154 දක්වා සියයට 22.4 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මේ අතර පවත්නා වෙළෙඳ

මිළ අනුව ආයෝජනය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1994 දි සියයට 27 විය. මුළු ආයෝජනයෙන් සියයට 88 ක් පමණ පෞද්ගලික අංශය තුළ ජනිතවූ අතර, ඒ තුළ යන්ත්‍ර උපකරණ, ප්‍රවාහණ උපකරණ,ඉදිකිරීම් හා සංනිවේදන ආදී අංශ සඳහා දැරූ ආයෝජන වියදම් සැලකිය යුතු මට්ටමක පැවතිනි. මේ අතර, පසුගිය වසරේ මෙන්ම 1994 වසරේද රජයේ ආයෝජන සංනිවේදන, වරාය සේවා, නල ජලය සැපයීම හා මාර්ග තැනීම ආදී පොදු කාර්ය පහසුකම් සංවර්ධනය කිරීම් යෝජනා ක්‍රමවලට සීමා විය.

මූර්ත වශයෙන් බලන කල පරිභෝජන වියදමෙහි 1993 දි පැවති සියයට 7.1 ක් වූ වර්ධන වේගය තරමක් අඩුවී 1994 දී සියයට 6.4 ක වේගයකින් වර්ධනය විය. මේ අතර, 1993 දී මූර්ත වශයෙන් සියයට 12.8 කින් පමණ වර්ධනය වූ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1994 දි සාපේක්ෂව අඩු වේගයකින්, සියයට 9.1 කින් වර්ධනය විය. රජයේ ආයෝජනය අඩුවීම සහ 1994 ආයෝජනය වර්ධනය අඩුවීමට බලපෑ සාධක ලෙස , සෘජු විදේශීය ආයෝජනය තරමක් පහත වැටීම දැක්විය හැකිය.

1994 දී දේශීය ඉතිරිකිරීම් රුපියල් බිලියන 88 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1993 දි පැවති රුපියල් බිලියන 80 සමඟ සසඳන විට සියයට 9.5 ක වර්ධනයකි. ඒ අනුව 1993 සියයට 15 සිට සියයට 16 දක්වා වර්ධනය වූ ඉතිරිකිරීම් අනුපාතය 1994 නැවත සියයට 15.2 දක්වා පහත වැටිනි. විදේශීය ශුද්ධ පෞද්ගලික සංක්‍රාම සහ විදේශීය ශුද්ධ සාධක ආදායමට අනුව ගැලපුම් කරන ලද දේශීය ඉතිරිකිරීම් හෙවත් ජාතික ඉතිරිකිරීම් 1994 දී රුපියල් බිලියන 111 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පවත්නා වෙළඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස සියයට 19.1 ක් විය. ඉකුත් වසරේ මෙම අනුපාතය සියයට 20.3 ක් විය.

## ආංශික ක්‍රියාකාරීත්වය

1993 වසරේදී සියයට 4.9 කින් වර්ධනය වූ කෘෂිකාර්මික අංශය 1994 දී සියයට 3.3 ක වර්ධනයක් වාර්තා කළේය. 1994 වර්ෂයේ කෘෂි අංශයේ වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ වී, තේ, පොල් සහ අනෙකුත් බෝග වර්ග කිහිපයකින් වාර්තා වූ ඉහළ නිෂ්පාදන තත්ත්වයයි. හිතකර කාලගුණික තත්වයන් කෘෂි අංශයේ අඛණ්ඩ වර්ධනයට ආධාරක විය. කෙසේ වුවත්, "අනෙකුත්" උප කාණ්ඩය සලකුණු කල ආන්තික අඩුවීම, සමස්ත කෘෂි අංශයේ වර්ධනය අඩු කිරීමට හේතු විය.

1994 වර්ෂයේදී වතු වැවිලි අංශයේ තේ, රබර් සහ පොල් බෝගයන්ගේ වර්ධන අනුපාතිකයන් පිළිවෙලින් සියයට 4.4 ක්, 1.0 ක් හා 20.6 ක් විය. මේ අතර, නිෂ්පාදනය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 4.7 කින් ඉහළ ගියේය. එහෙත් සියයට 0.1 ක ආන්තික අඩුවීමක් පෙන්වූ "අනෙකුත්" උප අංශයේ දුර්වල ක්‍රියකාරීත්වය මෙම ප්‍රධාන බෝග නිෂ්පාදනයන් වාර්තා කළ නිෂ්පාදන ඉලක්කයන්ගේ හිතකර බලපෑම තරමක් දුරට අඩුකිරීමට සමත් විය. "අනෙකුත්" උප කාණ්ඩය තුළ අතුරු ආහාර බෝග, උක්, සත්ව පාලන සහ කිරි නිෂ්පාදිත යන අංශයන්ගේ නිෂ්පාදනය ඉහළ ගිය අතර, සුළු අපනයන බෝග එළවළු සහ පළතුරු නිෂ්පාදනයන් අඩුවීම වාර්තා කළේය. 1993 වර්ෂය සඳහා සියයට 7.1 ඉහළ වර්ධන අනුපාතිකයන් පෙන්නු ධීවර උප අංශය 1994 වර්ෂයේදි සියයට 1.4 ක අඩු වර්ධනයක් වාර්තා කළ අතර, පසුගිය වසර කිහිපය තුළ වූ දැව සම්පත් ක්ෂය වී යාම පිළිබිඹු කරමින් දැව ආදි වන ද්‍රව්‍ය අංශය ආන්තික අඩුවීමක් සලකුණු කළේය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩු වර්ධන අනුපාතිකයක් දැක්වුවත්, 1994 වර්ෂයේ ආර්ථික වර්ධන ක්‍රියාවලියට ප්‍රමුඛ දයකත්වය සැපයුවේ නිමැවුම් කර්මාන්ත අංශයයි. 1994 වර්ෂය සඳහා මෙම අංශයේ වර්ධනය 1982 වර්ෂයේ ස්ථාවර සාධක මිළ අනුව සියයට 9.1 ක් වූ අතර, 1993 වර්ෂයේදී එම වර්ධන අනුපාතිකය සියයට 10.5 ක් විය. නිමැවුම් කර්මාන්ත අංශයට වැඩි දයකත්වයක් සපයන්නාවුත්, වැඩි අපනයන ආදයමක් ලබා දෙන්නාවුත් නිෂ්පාදන කර්මාන්ත උප අංශය 1994 දි සියයට 8.8 ක වර්ධනයක් දැක්විය. 1993 දී එම උප අංශයේ වර්ධනය සියයට 11.3 විය. වි. ගැ. හි. වට්නාකම අනුව සියයට 10.7 කින් වූ කාර්මික අපනයනයන්ගේ

1.6 සංඛ්‍යා සටහන

## ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1992- 1994

| අංශ | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | ද.ජා.නි.හි ප්‍රතිශතය වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රු. දශ ලක්ෂ) | | ද. ජා. නි. වැඩිවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992* | 1993* | 1994* | 1992* | 1993* | 1994* | 1993* | 1994* | 1993* | 1994* |
| 1. කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | 30,090 | 31,554 | 32,593 | 21.8 | 21.2 | 20.8 | 1,464 | 1,039 | 13.7 | 13.1 |
| 1.1 කෘෂිකර්මය | 25,316 | 26,592 | 27,596 | 18.3 | 17.9 | 17.6 | 1,276 | 1,004 | 12.0 | 12.7 |
| 1.1.1 තේ | 2,303 | 2,985 | 3,116 | 1.7 | 2.0 | 2.0 | 682 | 131 | 6.4 | 1.7 |
| 1.1.2 රබර් | 669 | 681 | 688 | 0.5 | 0.5 | 0.4 | 12 | 7 | 0.1 | 0.1 |
| 1.1.3 පොල් | 2,971 | 2,799 | 3,376 | 2.2 | 1.9 | 2.2 | -172 | 577 | -1.6 | 7.3 |
| 1.1.4 වී | 5,882 | 6,447 | 6,750 | 4.3 | 4.3 | 4.3 | 565 | 303 | 5.3 | 3.8 |
| 1.1.5 අනෙකුත් | 13,491 | 13,680 | 13,666 | 9.8 | 9.2 | 8.7 | 189 | -14 | 1.8 | -0.2 |
| 1.2 දැව ආදී වන ද්‍රව්‍ය | 2,149 | 2,151 | 2,147 | 1.6 | 1.4 | 1.4 | 2 | -4 | 0.0 | -0.1 |
| 1.3 ධීවර | 2,625 | 2,811 | 2,850 | 1.9 | 1.9 | 1.8 | 186 | 39 | 1.7 | 0.5 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 3,300 | 3,693 | 3,915 | 2.4 | 2.5 | 2.5 | 393 | 222 | 3.7 | 2.8 |
| 3. නිමැවුම් කර්මාන්ත | 26,059 | 28,806 | 31,418 | 18.9 | 19.4 | 20.1 | 2,747 | 2,612 | 25.8 | 33.0 |
| 3.1 තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සැකසීම | 2,912 | 3,157 | 3,567 | 2.1 | 2.1 | 2.3 | 245 | 410 | 2.3 | 5.2 |
| 3.2 නිෂ්පාදන කර්මාන්ත | 21,140 | 23,529 | 25,600 | 15.3 | 15.8 | 16.3 | 2,389 | 2,071 | 22.4 | 26.1 |
| 3.3 කුඩා සහ අනෙකුත් කර්මාන්ත | 1,150 | 1,208 | 1,277 | 0.8 | 0.8 | 0.8 | 58 | 69 | 0.6 | 0.9 |
| 3.4 අනෙකුත් | 857 | 912 | 974 | 0.6 | 0.6 | 0.6 | 55 | 62 | 0.5 | 0.8 |
| 4. ඉදිකිරීම් | 9,765 | 10,400 | 11,024 | 7.1 | 7.0 | 7.0 | 635 | 624 | 6.0 | 7.9 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා | 1,897 | 2,125 | 2,335 | 1.4 | 1.4 | 1.5 | 228 | 210 | 2.1 | 2.7 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සංනිවේදන | 16,606 | 17,287 | 17,823 | 12.0 | 11.6 | 11.4 | 681 | 536 | 6.4 | 6.8 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳාම | 30,074 | 32,584 | 34,667 | 21.8 | 21.9 | 22.1 | 2,510 | 2,083 | 23.5 | 26.3 |
| 7.1 ආනයන | 11,714 | 13,436 | 14,699 | 8.5 | 9.0 | 9.4 | 1,722 | 1,263 | 16.1 | 15.9 |
| 7.2 අපනයන | 3,695 | 4,190 | 4,726 | 2.7 | 2.8 | 3.0 | 495 | 536 | 4.6 | 6.8 |
| 7.3 දේශීය | 14,665 | 14,958 | 15,242 | 10.6 | 10.1 | 9.7 | 293 | 284 | 2.8 | 3.6 |
| 8. බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල | 7,241 | 8,023 | 8,785 | 5.2 | 5.4 | 5.6 | 782 | 762 | 7.3 | 9.6 |
| 9. නිවාස අයිතිය | 3,795 | 3,841 | 3,887 | 2.7 | 2.6 | 2.5 | 46 | 46 | 0.4 | 0.6 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු | 6,449 | 6,642 | 6,848 | 4.7 | 4.5 | 4.4 | 193 | 206 | 1.8 | 2.6 |
| 11. සේවා (අන් තැනක සඳහන් නොවන) | 5,714 | 5,828 | 5,974 | 4.1 | 3.9 | 3.8 | 114 | 146 | 1.1 | 1.8 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 140,990 | 150,783 | 159,269 | 102.1 | 101.4 | 101.7 | 9,793 | 8,486 | 91.8 | 107.2 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම | (2,916) | (2,039) | (2,607) | -2.1 | -1.4 | -1.7 | 877 | -568 | 8.2 | -7.2 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 138,074 | 148,744 | 156,662 | 100.0 | 100.0 | 100.0 | 10,670 | 7,918 | 100.0 | 100.0 |

* තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහබැංකුව.

වර්ධනය නිෂ්පාදන කර්මාන්ත උප අංශයේ වර්ධනයට ඉවහල් වූ කරුණක් විය. ආහාර සහ පානවර්ග, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත සහ ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත 1994 වර්ෂයේ නිෂ්පාදන කර්මාන්ත අතුරින් උසස් ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළ අංශ විය. වතු වැවිලි බෝගයන්ගේ නිෂ්පාදන ඉහළ යාම, තේ, රබර් සහ පොල් සැකසුම් කර්මාන්තයන්ගේ එකතු කළ අගයෙහි සියයට 13.0 ක මූර්ත වර්ධනයට හේතු වූ අතර, 1993 වර්ෂය සඳහා එම වර්ධනය 8.4 ක් විය. ආර්ථික ක්‍රියාකාරකම්හි වර්ධනයත්, නිෂ්පාදන කර්මාන්තයන්ගෙන් ලැබෙන අනුග්‍රයත් නිසා කුඩා කර්මාන්ත උප අංශය සියයට 5.7 කින් 1994 දී ප්‍රසාරණය විය. 1993 දී සියයට 6.4 ක වර්ධනයක් වාර්තා කළ "අනෙකුත්" කර්මාන්ත උප අංශය 1994 දි සියයට 6.8 ක වැඩි වීමක් පෙන්වන අතර මෙම වර්ධනයට වැඩිම දයකත්වය සපයා ඇත්තේ සහල් සැකසුම් කර්මාන්තයේ ඇති වූ ප්‍රසාරණයයි.

ඉදිකිරීම් අංශය අඛණ්ඩව තෙවෙනි වසර සඳහාත් යහපත් වර්ධන වේගයක් වාර්තා කරමින් 1994 දී සියයට 6.0 ක මූර්ත වර්ධනයක් පෙන්නුම් කළේය. මින් පිළිබිඹු කරන්නේ මෙම කාලය තුළ පෞද්ගලික අංශයේ නිවාස, වාණිජ හා කාර්මික ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රසාරණයයි. 1994 දී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ඊට පෙර වර්ෂය හා සසඳන විට පැවතුනේ අඩු මට්ටමකය. 1993 වර්ෂයේ සියයට 11.0 කින් ඉහළ ගිය බැංකු අංශය විසින් නිවාස ඉදිකිරීම් හා නිශ්චල දේපල සංවර්ධනය සඳහා දෙනු ලබන ණය ප්‍රමාණය 1994 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන දොළොස් මාසය තුළදී සියයට 38 කින් වර්ධනය වීම ඉදිකිරීම් අංශයේ ඇති වූ අඛන්ඩ ප්‍රසාරණය පිළිබිඹු කරයි.

1993 දි සියයට 11.9 කින් වර්ධනය වූ පතල් හා කැනීම් කටයුතු 1994 දී සියයට 6.0 ක වර්ධනයක් පෙන්නුම් කරඇත. මැණික් අපනයනය ඉහළ යාමත්, නිමැවුම් කාර්මාන්ත සහ ඉදිකිරීම් කටයුතු ප්‍රසාරණය වීම තුළින් කැනීම් අංශයේ අමුද්‍රව්‍ය සඳහා පවතින ඉල්ලුම ඉහළ යාමත්, මෙම වර්ධනයට හේතු විය. 1994 වර්ෂයේදී අගනා සහ අර්ධ අගනා ගල් අපනයන පරිමාණය සියයට 1.3 කින් ඉහළ ගොස් ඇති අතර, අපනයන වටිනාකම සියයට 9.8 ක වර්ධනයක් පෙන්වමින් වි. ගැ. හි. මිලියන 55.1 දක්වා වැඩිවී ඇත. කෙසේ වුවත්, අදල වර්ෂය තුළදී ඛණිජ ද්‍රව්‍ය, මිනිරන් සහ ඛණිජ වැලි නිෂ්පාදනය වාර්තා කළේ සෘණ වර්ධනයකි. ඒ අනුව මැණික් ප්‍රමුඛ පතල් උප අංශය 1994 දි වාර්තා කරන වර්ධනයට සියයට 1.5 කට සීමාවිය. කැනීම් උප අංශය සියයට 8 ක වර්ධන අනුපාතිකයක් සලකුණු කරමින්, පතල් හා කැනීම් අංශයේ මුළු වර්ධනයෙන් සියයට 75 කට දයක වි ඇත.

පසුගිය වර්ෂයේ සියයට 6.3 ක වර්ධනය හා සසඳන කළ, සේවා අංශය තවදුරටත් ප්‍රසාරණය වෙමින් 1994 වර්ෂය සඳහා සියයට 5.2 ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. සේවා අංශයේ ප්‍රවාහනය, ගබඩා කිරීම් සහ සංනිවේදන අංශය සියයට 3.1 කින් වර්ධනය වී ඇත. ප්‍රාථමික හා ද්විතීය අංශයන්ගේ ආර්ථික ක්‍රියාකාරකම්හි ඇති වූ ප්‍රසාරණය නිසා භාණ්ඩ නිෂ්පාදනය ඉහළ යාමත්, මෑත වර්ෂවල දී ධාරිතාවය පුළුල් කිරීමේ අරමුණෙන් සංනිවේදන උප අංශයට ගලා ආ සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රාග්ධන ආයෝජනයන් නිසා එම උප අංශයේ ක්‍රියාකාරීත්වය ඉහළ යාමත් මෙම වර්ධනයට හේතු විය.

තොග සහ සිල්ලර වෙළඳාම් අංශය 1994 වර්ෂයේදි සියයට 6.4 ක වර්ධන වේගයක් වාර්තා කල අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ආනයන හා අපනයන වෙළඳාමෙහි ප්‍රසාරණයයි. මෙම අංශයේ වර්ධනය, 1994 වර්ෂයේ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ සමස්ත වර්ධනයෙන් සියයට 26.3 කට දයක වි ඇත. 1994 දී අපනයන වෙළඳාම සියයට 12.8 ක වර්ධනයක් සලකුණු කළ අතර, ආනයන වෙළඳාම සියයට 9.4 කින් වර්ධනය විය.

මෙම වර්ෂය තුළදී යහපත් වර්ෂාපතනයක් ලැබීමේ හේතුවෙන් ජල විදුලිබලය උත්පාදනය සියයට 7.7 කින් වර්ධනය විය. 1993 ගෙ. වො. 3,979 ක් වූ සමස්ත විදුලිබල උත්පාදනය 1994 දි ගෙ. වො. 4,364 දක්වා වැඩි වූ අතර, එය සියයට 9.7 ක වර්ධනයක් වෙයි. විදුලිය, ජලය, ගෑස් සහ සනීපාරක්ෂක සේවා අංශයේ ඉහළ වර්ධන අනුපාතිකයට දයක වූ තවත් කරුණක් වූයේ, මෑත කාලයේ ප්‍රාග්ධන ආයෝජනයන් නිසා නල ජලය සැපයුමෙහි ඇති වූ ඉහළ යාමයි.

1993 දි සියයට 10.8 ක වැඩිවීමක් දැක්වූ බැංකු, රක්ෂණ හා නිශ්චල දේපළ අංශය 1994 දි සියයට 9.5 ක වර්ධනයක් පෙන්වයි. සුපුරුදු ලෙස මෙම අංශයේ ප්‍රමුඛ වූයේ විවිධ සේවා ව්‍යාප්ත කිරීම තුළින් ඉහළ වර්ධන අනුපාතයක් සලකුණු කළ බැංකු උප අංශයයි.

1993 දි පසුබෑමක් පෙන්නුම් කළ සංචාරක අංශය, සංචාරකයන්ගේ පැමිණීම් හා විදේශ විනිමය ඉපැයුම්වල (වි. ගැ. හි. වටිනාකමට අනුව) පිළිවෙලින් සියයට 3.9 ක හා සියයට 10.2 ක ඉහළයාමක් පෙන්වමින් යථා තත්වයට පත්විය. සංචාරක ව්‍යාපාරයේ වූ ප්‍රසාරණය නිසා "අනෙකුත්" සේවා අංශය (අ.නැ.නො.) ද පසුගිය වසරට වැඩි වර්ධන අනුපාතිකයක් (සියයට 2.5 ක්) 1994 දි සලකුණු කිරීමට සමත් විය.

## වියදම

පවත්නා මිළ ගණන් අනුව 1993 වර්ෂයේ රුපියල් බිලියන 547 ක් වූ දළ දේශීය වියදම, 1994 වර්ෂයේදි රුපියල් බිලියන 648 දක්වා වර්ධනය වෙමින්, සියයට 18.3 ක ඉහළ යාමක් සලකුණු කරයි. පරිභෝජන වියදම 1994 වර්ෂයේදි පසුගිය වර්ෂයට වඩා වැඩි වර්ධන අනුපාතිකයක් පෙන්නුම් කළ අතර, ආයොජන වියදම් වර්ධනයෙහි පසුගිය වර්ෂයට සාපේක්ෂව සුළු අඩුවීමක් දක්නට ලැබුනි. සියයට 17.0 ක වැඩිවීමක් පෙන්වමින් පාරිභෝජන වියදම 1994 වර්ෂය සඳහා බිලියන 491 ක් වූ අතර, රුපියල් බිලියන 157 ක් වූ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 22.4 ක වර්ධනයක් පෙන්විය. සමස්ත පාරිභෝජන වියදමෙන් රුපියල් බිලියන 435 ක් වූ පෞද්ගලික පරිභෝජනය සියයට 16.4 ක වර්ධනයක් පෙන්වූ අතර, රජයේ පාරිභෝජනය සියයට 22.5 කින් වර්ධනය වී ඇත. පසුගිය වර්ෂයේ පැවති රටාවට අනුව යමින්, ආනයනික භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා වන වියදම සියයට 24 ක ඉහළ වර්ධන වේගයක් සලකුණු කළ අතර, දේශිය භාණ්ඩ සඳහා වන වියදම වාර්තා කරන්නේ සියයට 13.6 ක සාපේක්ෂව අඩු වර්ධන අනුපාතිකයකි. ආනයනික පරිභෝජන භාණ්ඩ අතර, ආහාර හා පාන වර්ගත්, මෝටර් රථ හා විදුලි භාණ්ඩ වැනි කල්පවතින පරිභෝගික භාණ්ඩත් සැළකිය යුතු වර්ධනයන් වාර්තා කරයි. 1993 දි සියයට 11.8 කින් ඉහළ ගිය රාජ්‍ය අංශයේ පාරිභෝජන වියදම 1994 දි සියයට 22.5 ක ඉහළ වර්ධන වේගයක් වාර්තා කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ භාණ්ඩ හා සේවා මිළදීගැනීම් සඳහා එම අංශයේ වියදම සියයට 22 කින් ඉහළ යාමයි.

තොග වෙනස්වීම් ආදිය ද ඇතුලත් වන දළ දේශිය ප්‍රාග්ධන සම්පාදනය, 1994 වර්ෂය සඳහා රුපියල් බිලියන 157 ක් වන අතර එය 1993 දි වාර්තා කළ සියයට 23.9 ක ඉහළ යාමට සාපේක්ෂව සියයට 22.4 ක වර්ධනයකි. පසුගිය වර්ෂයන්හි පැවති උපනතිය අනුව යමින් 1994 වර්ෂයේදි ද ප්‍රාග්ධන සම්පාදනයට වැඩි දායකත්වයක් සලසනු ලැබූයේ පෞද්ගලික අංශයෙනි. පෞද්ගලික ආයෝජන වැඩි වශයෙන් යොමු වූයේ යන්ත්‍රෝපකරණ, ප්‍රවාහන උපකරණ, නේවාසික හා අනේවාසික ඉදිකිරීම් යන ක්ෂේත්‍රයන්ටය. මේ අතර, රජයේ ආයෝජනය වැඩි වශයෙන් යොමුවී තිබුනේ වරාය සේවා, සංනිවේදන, මහා මාර්ග හා නල ජලය සැපයීම වැනි පොදු කාර්ය පහසුකම් සංවර්ධනය කෙරෙහිය.

## සම්පත් හා සම්පත් උපයෝජනය

දළ දේශිය නිෂ්පාදනය සහ ආනයනික භාණ්ඩ හා සාධක නොවන සේවාවන්ගෙන් සමන්විත වන ආර්ථිකයේ උපයෝජනය සඳහා පවත්නා මුළු සම්පත් ප්‍රමාණය, 1993 දි පැවති රුපියල් බිලියන 716 සිට 1994 දි රුපියල් බිලියන 843 දක්වා සියයට 17.7 ක අනුපාතිකයකින් වැඩි විය. අදළ වැඩිවීම 1993 වර්ෂය සඳහා සියයට 19.4 ක් විය. 1994 වර්ෂයේ වූ රුපියල් බිලියන 127 ක් වූ සමස්ත සම්පත් වැඩිවීමෙන්, රුපියල් බිලියන 79 ක් වෙළෙඳපල මිළ අනුව දළ දේශීය නිෂ්පාදනයේ ඉහළ යාම නිසාද රුපියල් බිලියන 48 ක් භාණ්ඩ හා සාධක නොවන සේවාවන්ගේ ආනයනය ඉහළ යාම නිසාද සිදුවිය. 1993 දි සියයට 24.1 කින් ඉහළ ගිය භාණ්ඩ සාධක නොවන සේවා ආනයනයන් 1994 දී සියයට 22.2 ක වර්ධනයක් වාර්තා කළේය. 1994 වර්ෂයේදී උපයෝජනය සඳහා පැවති සම්පත් ප්‍රමාණයේ මූර්ත වටිනාකම සියයට 8.4 කින් වැඩි වූ අතර, පසුගිය වසරේදී එම වැඩිවීම සියයට 9.3 ක් විය.

## 1.7 සංඛ්‍යා සටහන

## සම්පත් සංයුතිය හා උපයෝගී කරගත් ආකාරය 1982- 1994

| ශීර්ෂය | පවත්නා වෙළෙඳ මිළ අනුව (රු. දශ ලක්ෂ) | | | | 1982 මිළ අනුව | | | | | | | | ප්‍රතිශතක වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982 | 1992* | 1993* | 1994* | 1982 | | 1992* | | 1993* | | 1994* | | | |
| | | | | | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | 1992ට වඩා 1993 | 1993ට වඩා 1994 |
| 1. මුළු සම්පත් | 145,143 | 599,791 | 716,304 | 843,397 | 145,143 | 100 | 215,077 | 100 | 235,016 | 100 | 254,783 | 100 | 9.3 | 8.4 |
| 1.1 වෙළෙඳ මිළ අනුව ද.දේ.නි. | 99,238 | 425,283 | 499,760 | 578,795 | 99,238 | 68 | 147,996 | 69 | 158,208 | 67 | 167,068 | 66 | 6.9 | 5.6 |
| 1.2 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 45,905 | 174,508 | 216,544 | 264,602 | 45,905 | 32 | 67,081 | 31 | 76,808 | 33 | 87,715 | 34 | 14.5 | 14.2 |
| 2. උපයෝගිකරණය | 145,143 | 599,791 | 716,304 | 843,397 | 145,143 | 100 | 215,077 | 100 | 235,016 | 100 | 254,783 | 100 | 9.3 | 8.4 |
| 2.1 පරිභෝජනය | 87,468 | 361,438 | 419,576 | 491,032 | 87,468 | 60 | 130,412 | 61 | 139,729 | 59 | 148,657 | 58 | 7.1 | 6.4 |
| 2.2 ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 30,279 | 100,039 | 126,070 | 154,310 | 30,279 | 21 | 35,399 | 16 | 39,946 | 17 | 43,571 | 17 | 12.8 | 9.1 |
| 2.2.1 රජය | 4,866 | 13,632 | 20,765 | 18,455 | 4,866 | 3 | 4,165 | 2 | 5,531 | 2 | 4,530 | 2 | 32.8 | -18.1 |
| 2.2.2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල | 25,413 | 86,407 | 105,305 | 135,855 | 25,413 | 18 | 31,234 | 14 | 34,415 | 15 | 39,041 | 15 | 10.2 | 13.4 |
| 2.2.3 පෞද්ගලික අංශය | | | | | | | | | | | | | | |
| 2.3 තොග වෙනස්වීම | 248 | 3,200 | 1,800 | 2,250 | 248 | - | 622 | - | 325 | - | 387 | - | -47.7 | 19.1 |
| 2.4 භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 27,148 | 135,114 | 168,858 | 195,805 | 27,148 | 19 | 48,644 | 23 | 55,016 | 24 | 62,168 | 25 | 13.1 | 13.0 |

* තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 1.8 සංඛ්‍යා සටහන
## ජාතික ඉතුරුම් (පවත්නා වෙළෙඳ මිල අනුව)

රු. දශ ලක්ෂ

| ශීර්ෂය | 1982 | 1992* | 1993* | 1994* |
|---|---|---|---|---|
| 1. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය | 99,238 | 425,283 | 499,760 | 578,795 |
| 2. දේශීය ඉතුරුම් | 11,770 | 63,845 | 80,184 | 87,763 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදායම | -1,959 | -7,821 | -5,979 | -8,028 |
| 4. විදේශිය ශුද්ධ පෞද්ගලික පැවරුම් | 5,494 | 20,253 | 27,090 | 30,989 |
| 5. ජාතික ඉතුරුම් | 15,305 | 76,277 | 101,295 | 110,724 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 2 අංක 1හි ප්‍රතිශතයක් ලෙස) | 11.9 | 15.0 | 16.0 | 15.2 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5 අංක 1හි ප්‍රතිශතයක් ලෙස) | 15.4 | 17.9 | 20.3 | 19.1 |

* තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ඒ අනුව ආර්ථිකයේ මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 58.2ක් පාරිභෝජනය සඳහා ද සියයට 18.6 ක් දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (ආයෝජනය) සඳහාද බෙදී ගිය අතර, අපනයනිත ප්‍රතිශතය සියයට 23.2 ක් විය. 1993 වර්ෂයේ සියයට 25.0 කින් ඉහළ ගිය භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනයන්හි මූල්‍ය වටිනාකම මෙම වසරේදී වාර්තා කර තිබුනේ සියයට 16 ක ඉහළ යාමකි. 1994 වර්ෂය සඳහා පවත්නා මිලගණන් අනුව පරිභෝජන වියදම් ඉහළ යාම සියයට 17.0 ක් වූ අතර, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පසුගිය වසරට සාපේක්ෂව සියයට 22.4 කින් ඉහළ ගියේය. 1994 දී, පරිභෝජන වියදම මූල්‍ය වශයෙන් 16.6 කින් වර්ධනය වූ අතර, දළ දේශීය ප්‍රාග්ධනය සම්පාදනයේ මූල්‍ය වශයෙන් වූ ඉහළ යාම සියයට 22.4 ක් විය. මූර්ත වශයෙන් පරිභෝජනය ඉහළ යාම සියයට 6.4 ක් විය. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයේ මූර්ත වර්ධනය සියයට 9.2 ක් වූ අතර, ඉදිකිරීම් සහ ප්‍රවාහන උපකරණ සඳහා කෙරුණු ආයෝජනයන් මේ අයුරින් ප්‍රධාන විය.